Article 11

# ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
# இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு
# HUMAN RIGHTS COMMISSION OF SRI LANKA

| | | |
|---|---|---|
| මගේ අංකය<br>எனது இல.<br>My No. | ඔබේ අංකය<br>உமது இல.<br>Your No. | දිනය<br>திகதி<br>Date 2020-07-02 |

පැමිණිලිකරුවන් : 1. කේ.එන්. විජේසූරිය මහතා.
අංක : එන් 65 ඒ, අම්බලන්පිටිය,
ගොඩගම්පල.

2. ජේ.පී.ඩී.එස්.කේ. විජේසිංහ මහතා.
අංක : 236/ඒ/1, යාය පාර,
ඇහැලියගොඩ.

වගඋත්තරකරුවන් : 1. උ.පො.ප. අතපත්තු මහතා.
පොලිස් ස්ථානය,
ඇහැලියගොඩ.

2. ස්ථානාධිපති,
පොලිස් ස්ථානය,
ඇහැලියගොඩ.

<u>පැමිණිලි අංක : **HRC/2501/17, HRC/2503/17**</u>

පැමිණිල්ල :-

HRC/2501/17 දරණ පැමිණිලිකරු විසින් මානව හිමිකම් කොමිෂන් සභාව හමුවේ පැමිණිල්ලක් ගොනු කරමින් සඳහන් කර ඇත්තේ, තමා ඇහැලියගොඩ, පුස්සැල්ලාව වැවිලි සමාගමට අයත් ඇහැලියගොඩ වතුයායේ සේවය කරන බවත්, 2017.07.24 වන දින දිවා ආහාරය ගැනීම සඳහා නිවස බලා පැමිණෙන අවස්ථාවේදී ජේ.පී.පී.ඩී.එස්.කේ. විජේසිංහ (දෙවන පැමිණිලිකරු) යන අය හමුවූ බවත්, ඔහු සමග කථා කරමින් සිටින අවස්ථාවේදී තිදෙනෙක් පොලු රැගෙන ඉදිරියට පැන මාංචු දමා කිලෝමීටරයක් පමණ එහායින් පිහිටි තමා සේවය කරන රබර් වත්තට ගෙන ගිය බවත්ය. එසේ රබර් වත්තට රැගෙන ගොස් පහරදුන් බවත්, එම පහරදීම සිදුකරන ලද්දේ ඇහැලියගොඩ පොලිස් ස්ථානයේ උ.පො.ප. අතපත්තු ඇතුළු නිලධාරින් දෙදෙනෙක් බවත් ප්‍රකාශ කර ඇත. මෙම පහරදීම නිසා 2017.07.25 වන දින ඇහැලියගොඩ රෝහලට ඇතුළු වී 2017.07.27 වන දින දක්වා ප්‍රතිකාර ලබාගත් බවත්, නැවත අසනීප තත්ත්වය වැඩි වූ



ප්‍රධාන කාර්යාලය / பிரதான அலுவலகம் / Head Office: 14, ආර්. ඒ. ද මෙල් මාවත, කොළඹ - 04. / 14, ஆர்.ஏ.த. மெல் மாவத்தை, கொழும்பு - 04. / 14, R. A. De Mel Mawatha, Colombo - 04.
දුරකථන / தொலைபேசி / Telephone: 94 -11- 2505580 / 81 / 82
සභාපති / தவிசாளர் / Chairperson: 011-2505451
ලේකම් / செயலாளர் / Secretary: 011-2505521
ෆැක්ස් / தொலைநகல் / Fax: 011-2505541 / 74
ක්ෂණික / துரித அழைப்பு / Hotline: 1996
ඊමේල් / மின்னஞ்சல் / e-mail: sechrc@gmail.com
වෙබ් / இணையம் / Web: www.hrcsl.lk

නිසා දින තුනකින් පසු නැවතත් ඇහැලියගොඩ රෝහලට ඇතුළු වූ බවත් වැඩිදුර ප්‍රතිකාර සඳහා රත්නපුර රෝහල වෙත යැවූ බවත්. රෝහලේ දින 3 ක් ප්‍රතිකාර ලබාගත් බවත් සඳහන් කර ඇත.

HRC/2503/17 දරණ පැමිණිල්ලේ පැමිණිලිකරු වන ජී.පී.ඩී.එස්.කේ. විජේසිංහ යන අය ප්‍රකාශ කර ඇත්තේ, 2017.07.24 වන දින තමා මිතුරෙකු හමුවීමට ගිය අවස්ථාවේදී වගඋත්තරකරුවන් අත්අඩංගුවට ගෙන කසිප්පු ප්‍රවාහනය කරනවා යැයි බොරු චෝදනාවක් මත අධිකරණයට ඉදිරිපත් කළ බවයි.

වගඋත්තරකරුවන්ගේ කරුණු දැක්වීම :-

- 01 වන වගඋත්තරකරුගේ කරුණු දැක්වීම :

2017.07.24 වන දින 01 වන පෙත්සම්කරු වන කේ.එන්. විජේසූරිය නොහොත් සුදා යන අයව ගෝඩා ලීටර් 310 ක් ළඟ තබා ගැනීම සම්බන්ධයෙන් කොට්ටුවන වත්තේ දී අත්අඩංගුවට ගෙන නඩු භාණ්ඩ වශයෙන් ගෝඩා බැරල් දෙකෙන් වෙන් වෙන් වශයෙන් ලබාගත් ගෝඩා මිලිලීටර් 750 බැගින් අඩංගු මුද්‍රා කළ සාම්පල් බෝතල් දෙකක්ද. ඉතිරි ගෝඩා විනාශ කිරීමෙන් අනතුරුව හිස් බැරල් දෙකක්ද. ගෝඩා කලවම් කිරීම සඳහා උපයෝගී කර ගන්නා ලද අඩි 4 1/2 ක් පමණ දිග පොලු කැබලි දෙකක් ද දේපළ කුවිතාන්සි අංක : 669/18 යටතේ ඇතුළත් කර පොලිස් ස්ථානයට ඉදිරිපත් කළ බවට ප්‍රකාශ කර ඇත.

දෙවන පෙත්සම්කරු වන හේවාදුරගේ සනත් කුමාර විජේසිංහ යන අයව WPYQ 6105 දරණ ත්‍රිරෝද රථයේ නීති විරෝධී මත්පැන් කසිප්පු මිලිලීටර් 33000 ක් ප්‍රවාහනය කිරීම සම්බන්ධයෙන් අම්බලන්පිටියේදී අත්අඩංගුවට ගෙන සැකකරු සන්තකයේ තිබූ කසිප්පු බූලියෙන් ලබාගත් මිලිලීටර් 750 ක් අඩංගු මුද්‍රා කළ සාම්පල් කසිප්පු බෝතල් සහ මිලිලීටර් 32250 ක් අඩංගු කසිප්පු මුද්‍රා කළ නිල් පාට ප්ලාස්ටික් බූලිය දේපළ කුවිතාන්සි අංක : 667/17 යටතේ සහ ත්‍රිරෝද රථය සහ එහි යතුර ආදායම් බලපත්‍රය සහ රක්ෂණ සහතිකය දේපළ කුවිතාන්සි අංක 668/17 යටතේ පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කළ බවත්. අනතුරුව දෙදෙනාගෙන් ප්‍රකාශ සටහන් කළ බවත්. 2017.07.26 වන දින ගරු මහේස්ත්‍රාත් අධිකරණයේ පෙනීසිටීමට උපදෙස් දී 2017.07.25 වන දින ඇප බැඳුම්කරයකට අත්සන් ලබාගැනීමෙන් පසුව මුදා හැරි බවත් සඳහන් කර ඇත. කේ.එන්. විජේසූරිය යන අයට අවිස්සාවේල්ල මහේස්ත්‍රාත් අධිකරණයේ අංක 16757 යටතේ ද ජී.පී.ඩී.එස්.කේ. විජේසිංහ යන අයට අවිස්සාවේල්ල මහේස්ත්‍රාත් නඩු අංක 16750 යටතේ ද නඩු පවරා ඇති බවත් මෙම නඩු විභාග වෙමින් පවතින බවත් වැඩිදුරටත් දක්වා ඇත.

පළවන වගඋත්තරකරු විසින් කොමිෂන් සභාව හමුවේ පැවැති 2018.04.19 දිනැති පරීක්ෂණයේදී පහත කරුණු දක්වා ඇත. මෙම වැටලීම සඳහා ඔහු ඇතුළු නිලධාරීන් තිදෙනෙක් සහභාගී වූ බවත්. පළමුව අත්අඩංගුවට ගනු ලැබුවේ සනත් කුමාර විජේසිංහ යන අය බවත්. අත්අඩංගුවට ගැනීමේදී විරෝධයක් දැක්වූ බවත්. අත්අඩංගුවට ගත් අවස්ථාවේදී පැන යාමට තැත් කළ බවත්ය. නමුත් අත්අඩංගුවට ගැනීමට බලයක් පාවිච්චි කිරීමට අවශ්‍ය නොවූ බවත්. පැන අල්ලා ගත් බවත් ප්‍රකාශ කර ඇත. වැටලීම සඳහා සිවිල්

ඇදුම්න් සහභාගි වූ බවට හා රිවෝල්වරයක් රැගෙන ගිය බවද මීට පෙර මෙම පැමිණිලිකරුවන් අත්අඩංගුවට ගෙන නොමැති බව ද ප්‍රකාශ කර ඇත.

දෙවන සැකකරු වන කේ.එන්. විජේසූරිය යන අයව අත්අඩංගුවට ගන්නා ලද්දේ පැය 16.00 ට බවත්, ඔහු අත්අඩංගුවට ගැනීමේදී බලය පාවිච්චි කිරීමක් සිදු නොවූ බවත්, ඔහුව තම ග්‍රහණයට නතු කර ගත් බවත් ප්‍රකාශ කර ඇත. එසේම, අධිකරණ වෛද්‍ය වාර්තාවේ ඇති තුවාල සම්බන්ධයෙන් තමා කිසිවක් නොදන්නා බව ද ප්‍රකාශ කර ඇත.

- දෙවන වගඋත්තරකරුගේ ප්‍රකාශය :-

2017.08.21 වන දින සිට තමා ඇහැලියගොඩ පොලිස් ස්ථානයේ ස්ථානාධිපති ලෙස රාජකාරි සිදු කරන බවත්, මෙම පෙත්සම්කරුවන් දෙදෙනාව අත්අඩංගුවට ගෙන ඇත්තේ 2017.07.24 වන දින බවත්, එම කාලය තුළ තමා ස්ථානාධිපති ලෙස කටයුතු නොකළ බවත් ප්‍රකාශ කර ඇත.

නිරීක්ෂණ :-

HRC/2501/17 දරණ පැමිණිල්ල යටතේ කේ.එන්. විජේසූරිය නැමති අය පැමිණිල්ලක් කර ඇති අතර, ඔහුව බොරු චෝදනාවක් මත අත්අඩංගුවට ගෙන අමානුෂික අන්දමින් පහරදුන් බවට පැමිණිලි කර ඇත. එසේම පහරදීම සම්බන්ධයෙන් ඇහැලියගොඩ මූලික රෝහලට ඇතුළු වී අධිකරණ වෛද්‍ය පරීක්ෂණයකට යොමු වී ඇති බව නිරීක්ෂණය වේ.

HRC/2503/17 යටතේ ජ්.පීඩී.එස්.කේ. විජේසිංහ යන අයව අත්අඩංගුවට ගෙන පහරදී බොරු චෝදනා යටතේ අධිකරණයට ඉදිරිපත් කර ඇති බවට පැමිණිලි කර ඇති අතර, ඔහු පහරදීම සම්බන්ධයෙන් අධිකරණ වෛද්‍ය පරීක්ෂණයකට යොමු වී නැති අතර, පහරදීම සම්බන්ධයෙන් අධිකරණයට ද ප්‍රකාශයක් කර නැති බවත් අත්අඩංගුවට ගැනීම හා පහරදීම සම්බන්ධයෙන් ඇසින් දුටු සාක්ෂි ඉදිරිපත් කර නොමැති බවත් නිරීක්ෂණය වේ.

- ➢ අධිකරණ වෛද්‍ය වාර්තා :-

පළවන පැමිණිලිකරු වන කේ.එන්. විජේසූරිය යන අයගේ අධිකරණ වෛද්‍ය වාර්තාව කොමිෂන් සභාව වෙත ලැබී ඇත. අධිකරණ වෛද්‍ය වාර්තාවට අනුව 2017.07.25 වන දින රෝහලට ඇතුළු වී ඇති අතර, 2017.07.29 දින දක්වා රෝහලේ ප්‍රතිකාර ලබාගෙන ඇත. 2017.07.29 වන දින අධිකරණ වෛද්‍ය පරීක්ෂණයකට යොමු කර ඇති අතර, රෝගියාගේ කෙටි ඉතිහාසයේ සඳහන් කර ඇත්තේ 2017.07.24 වන දින පොලිසිය විසින් පහරදුන් බවයි.

අධිකරණ වෛද්‍ය වාර්තාවේ තුවාල වල ස්වභාවය, ප්‍රමාණය, හැඩය සම්බන්ධයෙන් දක්වා ඇත්තේ බරපතල නොවන තුවාල 06 ක් ඇති බවයි. ඒවා

01. වම් උරහිසෙහි පිටුපස ඉහළ ප්‍රදේශයේ අගල් 5x1½ ක තැලීමක් ද

02. දකුණු උරහිසේ පිටුපස ප්‍රදේශයේ අගල් 4x1½ ක තැලීමක් ද

03. පිටුපස ඉහ පෙදෙසේ අගල් 3x1½ ක තැලීමක් ද

04. පිට මැද ප්‍රදේශයේ සීරීම් ද

05. ඉදිරිපස උඩුකය ඉහළ පෙදෙසේ අගල් 3x½ ක තැලීමක් ද

06. හිස පිටුපස දකුණු ප්‍රදේශයේ අගල් 1½ ක තැලීමක්ද වන බවට දක්වා ඇත.

දෙවන පැමිණිලිකරු ප්‍රතිකාර ලබා ගැනීම සඳහා රෝහල්ගත වී නොමැති වීම මත ඔහු සම්බන්ධයෙන් අධිකරණ වෛද්‍ය වාර්තාවක් හෝ වෛද්‍ය වාර්තා ඉදිරිපත් කර නැත.

ඉහත පරිදි පැමිණිලි අංක HRC/2501/17 - කේ.එන්. විජේසූරිය යන අයගේ අධිකරණ වෛද්‍ය වාර්තාවට අනුව ඔහුගේ ශරීරයේ තුවාල 06 ක් ඇති බවට වාර්තා වී ඇති අතර. රෝග ඉතිහාසයේ තමාට පොලිස් නිලධාරීන් විසින් පහරදුන් බවට සඳහන් කර ඇත. තවද අධිකරණ වෛද්‍ය වාර්තාවේ මෙම සිදුවී ඇති 1 හා 2 තුවාලයන් ලී පොල්ලකින් සිදුවූ තුවාල බවට වෛද්‍ය මතය පළකර ඇත. එසේම පැමිණිලිකරු රෝහල්ගත වීමේදී ද තමාගේ හිසට පිස්තෝලයෙන් පහරදුන් බවත් පිටපසට හා දෑත් වලට පොල්ලකින් පහරදුන් බවත් දක්වා ඇත. ඒ අනුව පැමිණිලිකරු සම්බන්ධව අධිකරණ වෛද්‍ය වාර්තාවේ දක්වා ඇති තුවාලයන් ඉහත දක්වන පහරදීම් ආකාරය හා සැසඳෙන බව නිරීක්ෂණය වේ.

වගඋත්තරකරු ඔහුගේ ප්‍රකාශයට අනුව පැමිණිලිකරු අත්අඩංගුවට ගැනීමට යාමේදී ප්‍රතිවිරෝධයක් දක්වා ඇති බවට සඳහන් කර ඇති නමුත්. බලය පාවිච්චි කිරීමක් නොකළ බවත්. වගඋත්තරකරුගේ ග්‍රහණයට පැමිණිලිකරු නතු කර ගත් බවත් සඳහන් කරන අතර පැමිණිලිකරුගේ අධිකරණ වෛද්‍ය වාර්තාවේ ඇති තුවාල සිදුවූ අන්දමක් නොදන්නා බව වගඋත්තරකරු ප්‍රකාශ කර ඇත.

පැමිණිලි අංක HRC/2503/17 යටතේ පැමිණිලිකර ඇති ජේ.පී.ඩී.එස්.කේ. විජේසිංහ යන අයට පහරදුන් බවට පැමිණිල්ලේ සඳහන් වුවත්. එය තහවුරු කිරීම සඳහා වෛද්‍ය වාර්තාව හෝ වෙනත් සාක්ෂි ඉදිරිපත් කිරීමට පැමිණිලිකරු අපොහොසත්වී ඇති බව නිරීක්ෂණය වේ.

වගඋත්තරකරුවන් විසින් ලබාදී ඇති වාර්තාවට අනුව අත්අඩංගුවට ගත් නිලධාරියා වන උ.පො.ප. අතපත්තු (වගඋත්තරකරු) ඇහැලියගොඩ පොලිස් ස්ථානයේ තොරතුරු සටහන් පොත් වල අදාළ අත්අඩංගුවට ගැනීම සම්බන්ධයෙන් (සුළු අපරාධ තොරතුරු සටහන් පොතේ 2017.07.24 වන දින පැය 18.55 ට පිටු අංක : 364 ඡේදය 152 හි) දක්වා ඇත්තේ අත්අඩංගුවට ගත් තැනැත්තන්ගේ සිරුරේ තුවාල නැති බවයි. නමුත්. එම සැකකරුවන් උපසේවයට භාරදෙන අවස්ථාවේදී උපසේවයේ යෙදී සිටි පො.සැ. 30575 අතුල යන නිලධාරියා පැය 19.30 ට සටහන් යොදා ඇත්තේ පළවන පැමිණිලිකරු වන නිමල් විජේසූරිය නැමති අය පරීක්ෂා කිරීමේදී සීරීම් තුවාල ඇති බවත්. දෙවන පැමිණිලිකරු වන සරත් කුමාර විජේසිංහ යන අය පරීක්ෂා කිරීමේදී සීරීම් තුවාල නැති බවට සටහන් යොදා ඇති බවත්ය.

මේ අනුව පලවන වගඋත්තරකරු තුවාල නැති බවට සඳහන් කර ඇති අතර, උපසේවා නිලධාරි පලවන පැමිණිලිකරුගේ සිරිම් තුවාල ඇති බවට සඳහන් කිරීම තුළින් ද පලවන පැමිණිලිකරුට පහරදීමක් සිදුවී ඇති බවට නිරීක්ෂණය වේ. එසේම මෙම පැමිණිලිකරුවන් දෙදෙනාටම විරුද්ධව මේවනවිටත් අවිස්සාවේල්ල මහේස්ත්‍රාත් අධිකරණයේ පිළිවෙලින් නඩු අංක : 16751 සහ 16750 යටතේ නඩු දෙකක් විභාග වෙමින් පවතී.

සුප්පයියා සිවකුමාර් එරෙහිව සැරයන් 6934 ජයරත්න සහ වෙනත් අය SCFR 56/2012 නඩුවෙහි අබේවික්‍රම එරෙහිව ගුණරත්න (1997) 3 SLR 225 යන නඩු තීන්දුව උපුටා දක්වමින් "බරපතල ගණයේ සැලකීමක් හෝ දඩුවමක් ලබා දීම තුළින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙහි 11 වන ව්‍යවස්ථාව සඳහා වන අවශ්‍යතා සපුරාගත හැකි බවට" සඳහන් කර ඇත.

තවද, විනිසුරු ජ්.ආර්.බී. අමරසිංහගේ "our Fundamental Right of personal Security and physical Liberty" යන කෘතිය උපුටා දක්වමින් එම නඩු තීන්දුවෙහි සඳහන්ව ඇත්තේ යම් පුද්ගලයෙකුට අන් අය ඉදිරියේ නින්දා කරනු ලැබුවහොත් හෝ ඔහුගේ කැමැත්තට හෝ හෘද සාක්ෂියට එරෙහිව ක්‍රියා කිරීමට පෙළඹවූවහොත් එය ඔහුව පහත්කොට සැලකීමක් වන ගණයට අයත් වන බවයි. ඒ අනුව අදාළ පෙත්සම්කරුගේ මූලික අයිතිවාසිකම් කඩවීමෙන් 11 වන ව්‍යවස්ථාව උල්ලංඝනය වී ඇති බවට එම නඩු තීන්දුවෙන් දක්වා ඇත.

තවද, කළුපහන එරෙහිව මහින්ද (1997) 13 SLR 331 හි සඳහන් කර ඇත්තේ, අනුකම්පාව පෙත්සම්කරු වෙත වන අවස්ථාවලදී පොලිස් සාක්ෂිවල පවතින පරස්පරතා කෙරෙහිද විනිශ්චයකරු හට අවධානය යොමු කළ හැකි බවයි.

නිගමනය :-

කේ.එන්.විජේසූරිය නැමති අයට අත්අඩංගුවට ගැනීමෙන් පසුව අමානුෂික අන්දමින් පහරදී ඇති බවට අදාල අධිකරණ වෛද්‍ය වාර්තාවට අනුව තහවුරු වේ. නමුත්, ජ්.පී.ඩී.එස්.විජේසිංහ යන අයට අමානුෂික අන්දමින් පහරදුන් බවට ඉදිරිපත් වී ඇති සාක්ෂි අනුව තහවුරු නොවේ.

මෙම දෙදෙනාටම විරුද්ධව අවිස්සාවේල්ල මහේස්ත්‍රාත් අධිකරණයේ නීති විරෝධි මත්පැන් සම්බන්ධයෙන් නඩුවක් විභාග වන බැවින් අත්අඩංගුවට ගැනීම නීත්‍යානුකූල නොවන අත්අඩංගුවට ගැනීමක් බවට නිගමනය කර නිර්දේශයක් ලබාදීමට හැකියාවක් නොමැත.

ඉදිරිපත්වී ඇති තොරතුරු මත කේ.එන්.විජේසූරිය යන අයට අමානුෂික අන්දමින් පහරදීම තුළින් 1978 ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවේ 11 වන ව්‍යවස්ථාවෙන් සහතික කර ඇති මූලික අයිතිවාසිකම් උල්ලංඝනය වී ඇති බවට මානව හිමිකම් කොමිෂන් සභාව මෙයින් නිගමනය කරනු ලැබේ.

නිර්දේශය :-

HRC/2501/17 යටතේ පැමිණිල්ල ඉදිරිපත් කර ඇති පැමිණිලිකාර කේ.එන්. විජේසූරිය යන අයගේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් සහතික කර ඇති 11 වන ව්‍යවස්ථාව උල්ලංඝනය කිරීම සම්බන්ධයෙන් 01 වන වගඋත්තරකරුට එරෙහිව සුදුසු නීතිමය පියවර ගැනීම සඳහා මෙහි පිටපතක් ජාතික පොලිස් කොමිෂන් සභාව වෙත යොමු කරනු ලැබේ.

HRC/2501/17 යටතේ පැමිණිල්ල ඉදිරිපත් කර ඇති පැමිණිලිකරුට සිදුවී ඇති අගතිය වෙනුවෙන් 01 වන වගඋත්තරකරු විසින් එකී කේ.එන් විජේසූරිය යන අයට මුදලින් රුපියල් 10,000/-ක වන්දි මුදලක් ගෙවන ලෙසට නිර්දේශ කිරීම සුදුසු වේ.

2020.08.04 වන දිනට පෙර මෙකී නිර්දේශය ක්‍රියාත්මක කර ඒ සම්බන්ධ වාර්තාවක් කොමිෂන් සභාව වෙත ලැබීමට සලස්වන ලෙස 1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් සභා පනතේ 15 වන වගන්තිය ප්‍රකාරව වගඋත්තරකරුවන් වෙත දන්වමු.

එසේම එකී නිර්දේශය ක්‍රියාත්මක වීම හෝ නොවීම සම්බන්ධව පැමිණිලිකරු විසින්ද ඉහත දින සිට සතියක කාලයක් තුළ කොමිෂන් සභාවට දැනුම් දිය යුතු වන අතර, එදිනට පෙර අදාළ දැනුම්දීම සිදු නොකරන්නේ නම් පසුව ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම් සම්බන්ධයෙන් සලකා නොබලන බවද වැඩිදුරටත් දන්වමු.

එම්. ගසාලි හුසේන්.
කොමසාරිස්.
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.
Commissioner
Human Rights Commission of Sri Lanka
No. 14, R.A. De Mel Mawatha,
Colombo 04.

රමණී මුත්තෙට්ටුවේගම.
කොමසාරිස්.
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.
Commissioner
Human Rights Commission of Sri Lanka
No. 14, R.A. De Mel Mawatha,
Colombo 04.

පිටපත :-

1. සභාපති,
ජාතික පොලිස් කොමිෂන් සභාව
බණ්ඩාරනායක අනුස්මරණ සම්මන්ත්‍රණ ශාලාව
කොළඹ 07.

2. පොලිස්පති
පොලිස් මූලස්ථානය
කොළඹ 01.

B/